# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

අංක 2319/38 - 2023 පෙබරවාරි මස 14 වැනි අඟහරුවාදා - 2023.02.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV (අ) වැනි කොටස - පළාත් සභා

### පළාත් සභා නිවේදන

**සබරගමුව පළාතේ පළාත් සභාව**

සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ නිවේදන

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනත සහ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185 (2) වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (ඇ) ව්‍යවස්ථාවෙන් මා වෙත පැවරී ඇති බලතල හා 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනත සහ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185 (2) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, සබරගමුව පළාතේ ආණ්ඩුකාරවර වන ටිකිරි කොබ්බෑකඩුව වන මම, කෑගල්ල දිස්ත්‍රික්කයේ, මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ සභාපති වන රංකොත් පේඩිගේ නොයෙල් දසන්ත ස්ටීවන් මහතා එකී ධූරයේ රාජකාරි කටයුතු කිරීමේ දී, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185(1) වගන්තියේ සඳහන් වැරදි කිසිවක් සිදුකර ඇත්ද යන්න සම්බන්ධයෙන් මෙම දැන්වීමේ සිට මාස තුනක කාල සීමාවක් ඇතුළත පරීක්ෂා කොට මා වෙත වාර්තා කිරීම සඳහා, විශ්‍රාමික මහාධිකරණ විනිසුරු හේරත් මුදියන්සේලාගේ රෝහණ අනුර කුමාර මහතා පත් කරමි.

මෙම විශ්‍රාමික මහාධිකරණ විනිසුරුහට මෙම පරීක්ෂණයට අදාළව පරීක්ෂණ කොමිෂන් සභා පනත යටතේ පත් කරන ලද පරීක්ෂණ කොමිෂන් සභාවක බලතල ඇත්තේ ය.

**ටිකිරි කොබ්බෑකඩුව,**
සබරගමුව පළාත් ආණ්ඩුකාරවර.

2023 පෙබරවාරි මස 14 වැනි දින,
රත්නපුර නව නගරයේ පිහිටි,
සබරගමුව පළාතේ ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

EOG 02 - 0148/1


1A - PG 6220— 07 (2023/02)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## සබරගමුව පළාතේ පළාත් සභාව

### සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ නිවේදන

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ දෙවන වගන්තිය සමග කියවිය යුතු සහ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185 (3) (අ) (i) වගන්තිය යටතේ කරනු ලබන නියමයයි.

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ දෙවන වගන්තිය සමග කියවිය යුතු සහ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185 (3) (අ) (i) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, සබරගමුව පළාතේ ආණ්ඩුකාරවර ටිකිරි කොබ්බෑකඩුව වන මම, මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ සභාපති රංකොත් පේඩිගේ නොයෙල් දසන්ත ස්ටීවන් මහතා එම ධුරය දැරීම වහාම ක්‍රියාත්මක වන පරිදි තාවකාලිකව අත්හිටුවමි.

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ දෙවන වගන්තිය සමග කියවිය යුතු සහ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185 (3) (අ) (i) උප වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව වහාම ක්‍රියාත්මක වන පරිදි සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ කාර්යය ඉටු කිරීමට හා එහි බලතල ක්‍රියාත්මක කිරීමට, එකී මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ උප සභාපති කෝරලේ ගෙදර පියතිස්ස මහතාට නියෝග කරමි.

**ටිකිරි කොබ්බෑකඩුව,**
සබරගමුව පළාත් ආණ්ඩුකාරවර.

2023 පෙබරවාරි මස 14 වැනි දින,
රත්නපුර නව නගරයේ පිහිටි,
සබරගමුව පළාතේ ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

EOG 02 - 0148/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.